# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 03

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JUNE 10, 2010 ජුනි මාසය (බුද්ධ වර්ෂ 2554 පොසොන් මාසය)

http://www.lankaheritage.com/lankaviththi/




Ruwanweli Maha Seya in Anuradhapura - *Sri Lanka* අනුරාධපුරයේ රුවන්වැලි මහා චෛත්‍ය රාජයා

## Ruwanweli Maha Seya

The Ruwanweli Maha Seya, a stupa in Anuradhapura, Sri Lanka, is considered a marvel for its architectural qualities and sacred to many Buddhists all over the world. It was built in the 2nd century B.C by the Sinhala hero-King Dutugemunu, who became lord of all Sri Lanka after a war in which the Chola King Elara, was defeated. It is also known as Mahathupa, Swarnamali Chaitya and Rathnamali Dagaba.

The stupa is also one of the Solosmasthana (the 16 places of veneration) and the Atamasthana (the 8 places of veneration in the ancient sacred city of Anuradhapura). The stupa is one of the world's tallest monuments, standing at 300 ft (92 m) and with a circumference of 950 ft (292 m).

Every monastery has a dagoba. Ruvanveliseya is the dagoba of Maha Viharaya. The architect ingeniously combined the Buddhist philosophy in the architectural conception. He conceived this as a bubble of milk: representing life, which will burst in no time just like the fragility of our lives. Its dome represents the vastness of the doctrine; the four facets of the box on top represents the four noble truths. The concentric rings there after indicate the noble eightfold path that leads man to illumination. The illumination: the whole truth is light and transparent like the rock crystal at the pinnacle.

# පරිසර හානි විපාක

♦ සංජය විමලරත්න විසිනි

**අ**ප මෙහි ලියූ බොහෝ දේ ප්‍රධාන වශයෙන් ශ්‍රීලංකාවේ ත්‍රස්ත විරෝධී යුද්ධයත්, එයට පසු ඡන්ද සටනුත් සඳහා වූ බැවින් ඒ සමානවම අප කාගේත් අවධානය යොමුවිය යුතු වූ වෙනත් වැදගත් දේවල් රැසක් පසුබිමට ගොස් තිබුණි. දැන් අප රට කිසියම් ස්ථාවරයකට පැමිණ ඇති නිසාත්, වහා අවධානය යොමු වියයුතු කරුණු රැසක් මතුව ඇති නිසාත් ඒ වෙත පාඨක සිත් යොමුකරලීම පිණිස මෙය ලියන්නට සිතුවෙමු.

## පාරිසරික ප්‍රශ්න

කලක් තිස්සේ සිදුවෙමින් තිබුණු හා තිබෙන අප රටේ සිදුවන පරිසර හානිය සහ එහි ප්‍රතිවිපාක ගැනය මේ. පසුගිය මැයි **15** වෙනිදා පමණ සිට දින කීපයක් රටට ගලා හැලුණු ධාරානිපාත වර්ෂාව නිසා පළාත් ගණනාවකටම විශාල ගංවතුර හානි සිදුවූ බවද රටේම වැඩ කටයුතු දින කීපයක් ඇනහිටි ආකාරයද පුවත්පත් හා විද්‍යුත් මාධ්‍යයෙන් වාර්තා විය. නිරිත දිග මෝසම් වැසි අපේක්ෂිත මේ සමයේ එය වැඩියෙන්ම බලපාන දකුණු, බස්නාහිර සහ සබරගමු පළාත්වල සමහර ප්‍රදේශවලට මේවා තදින්ම බලපැවැත් විය. මේ වැහි රවුම නිසා මරණ හයක්ද, තුන් ලක්ෂයක පමණ ජනකායක් අවතැන්වූ බවද සඳහන් විණ. පැය කීපයක් නොකඩවා ඇද හැළුණු එම වර්ෂාපතනය නිසා කොළඹ නගරය වටා මෙන්ම ඉතා ජනාකීර්ණ ප්‍රදේශ වන ගම්පහ, මීගමුව, නිට්ටඹුව, මතුගම, හංවැල්ල ආදී ප්‍රදේශ රාශියක් යටවී, සියළු කටයුතු අඩාල වී තිබුණු බැව් වාර්තා විය.

අහල් **2** ක, **3** ක වර්ෂා පතනයක් පැය කීපයකින් වැටීමෙන් කොළඹ නගරය සම්පූර්ණයෙන්ම වාගේ යටවූ තත්වයක් ඇතිවිය. ප්‍රධාන නගරයට දහවල් කාලයේදීම මෙය සිදුවීම නිසා එය මුළු රටටම බලපාන තත්වයක් විය. අන් සඳහන් තැන් වල නම් අහල් **7, 8, 10** වැනි වැසි ප්‍රමාණ නිසා ය. මංමාවත්, ව්‍යාපාර, ගේ දොර ආදියට සිදුවූ හානිවල ආදීනව දැනුදු පවතියි.

## අනතුරු ඇඟවීමක්

තවම නිරිත දිග මෝසම් සුළං වැසිවාරය තදින් අරඹා නැත. එය තව ඉදිරියටය. මේ වැටුණු වැසි එහි සුළු පෙරහුරුවක් ලෙස සැලකිය හැකිය. අපේ ප්‍රධාන නගරයත් එය වටා ජනාකීර්ණ ප්‍රදේශවලත් පරිසරයේ ඇති අසතුටුදායක තත්වය පිළිබඳව මෙය හොඳ අනතුරු ඇඟවීමක් ලෙස සැලකීම හොඳය.

## වහා කළයුතු පිළියම්

ආපදා කළමනාකරන අමාත්‍යංශය මගින් මේ සිදුවූ ආපදාවන්ට වහා කළයුතු පිළියම් යෙදීම අවතැන්වූ ජනයාට සහන සැලසීම ආදිය කඩිනමින් කර ඇත. මේවා කාලයක් තිස්සේ වැස්ස වැටුණු විට කෙරෙන දේ බවට පත්ව තිබේ. මේවා හොඳය. එහෙත් ස්ථාවර විසඳුම් නොවේ.

මෙම පාරිසරික ප්‍රශ්නයට ජනාධිපතිතුමාගේ අවධානය යොමුව ඇති අතර, ඉහළ මට්ටමේම ඇමති මඬුල්ලක් මේ සඳහාම පත්කොට ප්‍රශ්නය ගැන කටයුතු කිරීමට විධානය කර ඇත. විශේෂයෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන බවද වාර්තාවී තිබුණි. ස්ථිර සාර වැඩ පිළිවෙලක් ඇරඹී ඇති බව පෙනී යයි. එය සතුටට කරුණකි.

## පරිසර හානි

පරිසර හානි, ගෝලීය වශයෙන් සිදුවන මහා පරිමාණයේ ඒවා සහ රටවල් මට්ටමින් වන සුළු ප්‍රමාණයේ ඒවා වශයෙන් වර්ග දෙකකි.

## මහා පරිමාණයේ හානි

මුලදී මෙම පරිසර දූෂණයට වගකිවයුත්තන් වූයේ ඇමරිකාව පුමුඛ බටහිර යුඅරෝපීය රටවල්ය. නමුත් ජපානය, රුසියාව සහ මෑතකදී චීනය සහ ඉන්දියාව වැනි විශාල රටවල්ද කාර්මිකවීමෙන් සහ ගෝලීය කරණයට එක්වීමෙන් මහා පරිමාණයේ ඉන්ධන භාවිතය ඇරඹිණ. අප රටේ මෙන්ම දැන් ලෝකයේ හැම රටකම වගේ දැනෙන දැඩි රශ්නය, තද නියඟ, තද සීතල සමය, අවාරයේ කඩා හැලෙන ධාරාණිපාත වැසි ආදිය සියල්ල එහි ප්‍රථිපල වෙති. මේවාට අනුවර්තනය වෙමින් එම දුර්විපාක වලක්වා ගැනීම හැර අපගේ වැනි රටවලට වෙන කළ හැකි දෙයක් නැත.

## සුළු පරිමාණයේ හානි

මේවා රටවල් මට්ටමේ කටයුතු වලදී පරිසරය ගැන නොතකා කාලයක් කටුයුතුකිරීමේ ආදීනවය. කොළඹ සහ එවැනි ජනාකීර්ණ පරිසර වල සුළු වැස්සකින් පවා ජලය ගැලීම් යටවීම් සිදුවන්නේ ජලය ස්වාභාවිකව බැස යන කාණු ඇල මාර්ග ආදිය

4 වන පිටුව බලන්න ➛

සුපුන් සඳ දිලෙන පෝදා පොසොන් මස
පහන් සිත් වැඩෙයි ඉහළට අහස් කුස
රුවන් වැලි මහා සෑ රද උතුම් ලෙස
පුදන් නට යමුද ඔබ අප උපන් දෙස

On **Poson Day** the sky beaming with full-moon light
Purifies inner thoughts, lifting them to sublime height
To venerate **Ruwanweli Seya** - the grand golden dome
Let's go to **Sri Lanka** - the land of our birth and home!

♦ දයා ආනන්ද රණසිංහ ♦ *Daya Ananda Ranasinghe*




ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3